# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා උපාධිධාරීන්ගේ රැකියා ගැටළුව පිළිබඳ කළමනාකරණ උපාධිධාරීන් ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක්.

1995/97 අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව සඳහා ඉදිරිපත් කරන නිබන්ධනය.

විභාග අංකය : 313

ලි.ප. අංකය : 94 / M.Phil / 37

එස්. ඒ. දීපා කුමාරි සේරසිංහ
(වාණිජවිද්‍යා විශේෂ, අධ්‍යාපන ඩිප්ලෝමා)
අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 3.

UCLIB
504716

University of Colombo
Library
Sri Lanka

# අධ්‍යයනය ගැන කෙටියෙන්

උපාධිධාරීන් බිහිකරනු ලබන්නේ රටක ආර්ථික සංවර්ධන කාර්ය සඳහා දායක කර ගැනිමටය. එහෙත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුලින් බිහිවන උපාධිධාරීන් තුල රැකියා ප්‍රශ්නයක් පැවතීමෙන් පෙනී යන්නේ ඔවුන් එකී කාර්යයට දායකකර ගැනීම පිලිබඳව ප්‍රශ්න පවතින බවයි. උපාධිධාරීන් රැකියා ප්‍රශ්නයකට මුහුණදීම නිසා ශ්‍රී ලංකාව තුල ආර්ථික, සමාජ, දේශපාලන ප්‍රශ්න රැසක් බිහිවී තිබේ. එහෙත් මේ ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රමානවත් අවධානයක් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ පැත්තෙන් හෝ විශ්වවිද්‍යාල බලධාරීන්ගේ පැත්තෙන් හෝ මෙ දක්වා යොමුවී නොමැත. පවතින විශ්වවිද්‍යාලවලට වාර්ෂිකව බඳවා ගන්නා ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය කිරීමත්, නව විශ්වවිද්‍යාල බිහි කිරීමත්, බාහිර උපාධි පාඨමාලා ගණනාවක් මෑතක සිට හඳුන්වා දී තිබීමත්, එකී උපාධි පාඨමාලාවලට සිසුන් යොමු කිරීම සඳහා රාජ්‍ය ආයතන කටයුතු කිරීමත් මේ ප්‍රශ්නය තවදුරටත් ඉදිරියේදී බරපතල කරවනු ඇත.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් ලබා දෙන න්‍යායාත්මක දැනුම හා ව්‍යාපාර ආයතන අපේක්ෂා කරන කළමනාකරණ හැකියා අතර නොගැලපීම නිසා හෝ කළමනාකරණ උපාධිධාරීන් අවශෝෂණය කරගැනිමට තරම් ප්‍රමාණවත් වේගයකින් ආර්ථිකය වර්ධනය නොවීම නිසා හෝ බිහිවී ඇති කළමනාකරණ උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය අධ්‍යයනය කිරීම තුලින් උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය පිලිබඳව අවබෝධයක් ලබා ගත හැකිය.

එබැවින් කළමනාකරණ උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය මේ අධ්‍යයන සඳහා යොදාගත් ගැටළුව වේ. එම ගැටළුව අධ්‍යයනය කරනුයේ කළමනාකරණ උපාධි පාඨමාලාවල අරමුණු ඒවායේ විෂය අන්තර්ගතය, ව්‍යාපාර ආයතන අපේක්ෂා කරන කළමනාකරණ හැකියා බිහිකිරීමට සමත් වේද යන්න සොයා බැලීම, කළමනාකරණ උපාධි පාඨමාලාවල ගුණාත්වය පිරිහීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ බලපෑමක් සිදුවී ඇද්ද යන්න අධ්‍යයනය කිරීම, කළමනාකරණ උපාධි පාඨමාලා තුලින් ලබාගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ දුෂ්කරතා පවතී ද යන්න විමර්ෂණය කිරීම, විශ්වවිද්‍යාල සිසුන්ගේ ආකල්ප, ක්‍රියාකාරකම්, සමාජ සම්බන්ධතා හා හැකියා ඔවුන්ට විවෘතව ඇති රැකියා අවස්ථා බලපෑමක් තිබේද යන්න සොයා බැලීම, පෞද්ගලික අංශයේ රැකියා සඳහාත්, ස්වයං සේවා නියුක්තිය සඳහාත් කළමනාකරණ උපාධිධාරීන්ගේ නැඹුරුව තීරණය කෙරෙන සාධක අනාවරණය කර ගැනීම, කළමනාකරණ උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ග යෝජනා කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහාය. ඉහත අරමුණු පර්යේෂනාත්මකව අධ්‍යයනය කිරීම මේ අධ්‍යයනයේ මූලික පරමාර්ථය වේ.

අධ්‍යයනය තුලින් කරුණු ගණනාවක් අනාවරණය කර ගැනීමට හැකිවිය.

කළමනාකරණ උපාධි පාඨමාලා තුලින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු ඒ ඒ විශ්වවිද්‍යාල පැහැදිලිව දක්වා නොමැත. ඇතැම් කළමනාකරණ උපාධි පාඨමාලා තුලින් ලබාදෙන න්‍යායාත්මක දැනුම ව්‍යාපාර ආයතන අපේක්ෂා කරන කළමනාකරණ හැකියා බිහිකිරීමට සමත් වුවත් ඇතැම් කළමනාකරණ උපාධි පාඨමාලාවන්හි විෂය

අන්තර්ගතය ව්‍යාපාර ප්‍රජාව අපේක්ෂා කරන කළමනාකරණ හැකියා බිහිකිරීමට සමත් වී නොමැත. මෙම තත්ත්වය විශ්වවිද්‍යාල අතරත් එක් එක් පීඨයේ කළමනාකරණ උපාධි පාඨමාලා අතරත් දක්නට ලැබුණි.

කළමනාකරණ උපාධි පාඨමාලා තුළින් බිහිවන කළමනාකරණ උපාධිධාරීන්ගේ ගුණාත්වයේ පිරිහීමක් දක්නට ලැබේ. මේ සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බලපා තිබේ. ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගේ හිඟය, පාඨමාලා යාවත්කාලීන නොකිරීම, පාඨමාලාවලට සිසුන් විශාල සංඛ්‍යාවක් එකවර අනුයුක්ත කිරීම, ඉගැන්වීම් උපකරණ ප්‍රමාණවත් අයුරින් නොලැබීම, ආචාර්යවරු සඳහා අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් අයුරින් නොලැබීම, අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් ප්‍රමාණවත් දායකත්වයක් නොලැබීම, ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමේ දුෂ්කරතාව, ඉගැන්වීම් ක්‍රියාවලිය මැනවින් සිදු නොවීමට බලපා තිබේ. සිසුන්ගේ වරණය මත විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ඉඩ නොලැබීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමෙන් පසු අපේක්ෂිත රැකියා නොලැබී යාම, ඉගැන්වීමේ ක්‍රියාවලියේ පවතින දුර්වලතා, රැකියා කරමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නිරත වීම, සමගාමී පාඨමාලාවන්හි අධ්‍යාපන කටයුතුවල නියුක්ත වීම, සිසුන් තුළ ආර්ථික ප්‍රශ්න පැවතීම, දේශපාලන කටයුතුවලට යොමුවීම, ආචාර්යවරු හා සිසුන් අතර සම්බන්ධතාව අඩුවීම, සිසු ප්‍රශ්න වලට විසඳුම් ලබාදීමේ ක්‍රමයන් ක්‍රියාත්මක නොවීම විශ්වවිද්‍යාල සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය දුර්වල කිරීමට බලපා තිබේ.

කළමනාකරණ උපාධි පාඨමාලා තුළින් ලබාගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ දුෂ්කරතා පවතී. එහෙත් ඉතා කෙටිකාලයක් තුළ කළමනාකරණ උපාධිධාරීන්ට අනුවර්තනය වීමේ හැකියාව තිබේ. ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම තුළින් න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික ගත කිරීමේ ක්‍රියාවලිය විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ම කොටසක් ලෙස පවතී.

විශ්වවිද්‍යාල සිසුන්ගේ ආකල්ප, ක්‍රියාකාරකම්, සමාජ සම්බන්ධතා හා හැකියා, ඔවුන්ට විවෘතව ඇති රැකියා අවස්ථා අහිමිකිරීමට බලපා නොමැත. එහෙත් විශ්වවිද්‍යාල සිසුන්ගේ ආකල්ප හා ක්‍රියාකාරකම් පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා සීමා කිරීමට බලපා තිබේ. එසේම විශ්වවිද්‍යාල සිසුන්ගේ සමාජ සම්බන්ධතා හා හැකියා ව්‍යාපාර ප්‍රජාව අපේක්ෂා කරන මට්ටමින් නොපවතී.

සමාජ පිළිගැනීම, රැකියා සුරක්ෂිත බව, අමතර ප්‍රතිලාභ, හා නොදැනුවත්කම කළමනාකරණ උපාධිධාරීන් රාජ්‍ය අංශයේ රැකියා සඳහා වැඩි කැමැත්තක් දැක්වීමට හේතු වී තිබේ. සමාජ පිළිගැනීමක් නොලැබීම, අරමුදල් හිඟය, අවදානම්වලට මුහුණදීමේ අකමැත්ත, ව්‍යවසායකත්ව හැකියා නොමැතිවීම, කළමනාකරණ උපාධිධාරීන් ස්වයං රැකියා සඳහා යොමු නොවීමට බලපා තිබේ.

කළමනාකරණ උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා කැරෙන යෝජනා අධ්‍යයනයේ අරමුණු ඔස්සේ සාරාංශ කැරේ.

කළමනාකරණ උපාධි පාඨමාලාවල අරමුණු පැහැදිලිව නිශ්චය කිරීමටත් එකී අරමුණු ඉටුකරගත හැකිවන ලෙස පාඨමාලා සංශෝධනය කිරීමටත්



University of Colombo Library Sri Lanka

විශ්වවිද්‍යාල ආචාර්යවරු ක්‍රියාකළ යුතුය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා කැරෙන විවිධ බලවේග ඉවත් කිරීමට රජයත්, විශ්වවිද්‍යාල බලධාරීනුත් පියවර ගත යුතුය. සිසුන්ගේ අධ්‍යාපන උනන්දුව ඉහළ නැන්වීම සඳහා ඔවුන් දැනුවත් කිරීමටත්, ඒ සඳහා ඔවුන් පොළඹවීමටත් විශ්වවිද්‍යාල ආචාර්යවරු පියවර ගත යුතුය. කළමනාකරණ උපාධි පාඨමාලා තුළින් ලබාදෙන න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ලබාදෙනු වස් ප්‍රායෝගික පුහුණුව විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ කොටසක් බවට පත් කළ යුතුය. ආයතනවල සේවයේ නියුක්ත කරවීම මගින් එකී පුහුණුව ලබාදීම දුෂ්කර වන අවස්ථාවලදී, නිබන්ධන, පැවරුම්, ස්වාධීන අධ්‍යයන, ක්ෂේත්‍ර චාරිකා, වැඩ මුළු, සම්මන්ත්‍රණ යනාදිය මගින් ව්‍යාපාර කටයුතුවල ප්‍රායෝගික භාවිතය පිළිබඳව අවබෝධයක් ලබාදීමට විශ්වවිද්‍යාල ආචාර්යවරු පියවර ගත යුතුය.

ව්‍යාපාර ප්‍රජාව පිළිබඳව විශ්වවිද්‍යාල සිසුන් තුළ තිබෙන ආකල්ප වෙනස් කිරීමටත්, විශ්වවිද්‍යාල ප්‍රජාව අපේක්ෂා කරන පුද්ගල ගුණාංග විශ්වවිද්‍යාල සිසුන් තුළ වර්ධනය කිරීමටත් විවිධ ක්‍රියාමාර්ග විශ්වවිද්‍යාල ආචාර්යවරු ගත යුතුව ඇත. ව්‍යාපාර ප්‍රජාව සම්බන්ධ කරගනිමින් විශ්වවිද්‍යාල සිසුන්ගේ ශුභසාධනය සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, ව්‍යාපාර ප්‍රජාවට අවශ්‍ය කෙටිකාලීන පාඨමාලා විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යාමට පියවර ගැනීම, ව්‍යාපාර ප්‍රජාව හා විශ්වවිද්‍යාල සිසුන් සම්බන්ධවන ආකාරයේ වැඩ මුළු පැවැත්වීම යනාදිය මගින් විශ්වවිද්‍යාල සිසුන් හා ව්‍යාපාර ප්‍රජාව අතර පවතින අනවබෝධය ඉවත් කිරීමට පියවර ගත යුතුය. මේ සඳහා විශ්වවිද්‍යාල සිසුන් මෙන්ම ආචාර්යවරු ද මූලිකත්වය ගෙන ක්‍රියාකළ යුතුය.

පෞද්ගලික අංශයේ රැකියා සඳහා විශ්වවිද්‍යාල සිසුන් යොමු කරවීමේ වැඩ පිළිවෙලක් විශ්වවිද්‍යාල තුළින් ක්‍රියාත්මක කළ යුතුය. පෞද්ගලික අංශයේ රැකියාවල සුරක්ෂිතතාව ඇති කිරීමටත්, විශ්‍රාම වැටුප්, අඩු පොලී ණය, යනාදිය පෞද්ගලික අංශයේ ආයතන තුළින්ද ලබාදීමට පියවර ගැනීම තුළින් එකී ආයතනවලට සිසුන් යොමු කරවීමට විදිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. ස්වයං රැකියා සඳහා සිසුන්ට අවශ්‍ය දැනුම උපාධි පාඨමාලා තුළින් ලබාදීමට විශ්වවිද්‍යාල ආචාර්යවරුන් පියවර ගැනීම තුළිනුත්, ස්වයං රැකියා සඳහා අවශ්‍ය අරමුදල් හා අනෙකුත් පහසුකම් රජය මගින් ලබාදීමට පියවර ගැනීම තුළිනුත් කළමනාකරණ උපාධිධාරීන් ස්වයං රැකියා සඳහා යොමු කිරීමට පියවර ගත යුතුය.

ආර්ථික වර්ධනය වේගවත් කිරීමට පියවර ගැනීම, ආර්ථික වර්ධනයට අවශ්‍ය ප්‍රමාණයෙන් පාඨමාලා සඳහා සිසුන් ඇතුලත් කිරීම, ව්‍යාපාර ප්‍රජාවට අවශ්‍ය කළමනාකරණ හැකියා බිහිකිරීමට සමත් ආකාරයෙන් විෂය මාලා සංශෝධනය කිරීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට එල්ලවී ඇති බාධා ඉවත් කිරීම, ව්‍යාපාර ප්‍රජාව සමග යහපත් සම්බන්ධතා ගොඩ නගා ගැනීම, උපාධිධාරීන් ස්වයං සේවා නියුක්තියට යොමු කිරීම, යනාදි ක්‍රියාමාර්ග ගැනීම තුළින් කළමනාකරණ උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් සෙවිය යුතුය.